Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී පවතින පහත තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | *සේවා ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්, අමතර සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | PL 1- 2016 ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය III ශ්‍රේණිය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි පීඑල්1-2016 වැටුප් ඛණ්ඩය අනුව රු. 24,250- 250x10-270 x 10- 300 x 10 - 330 x 12- රු. 36,410 මාසික වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවේ. සේවයේ නියුක්ත කරවන දිනට ඉහත කී චක්‍රලේඛයේ උපලේඛන II හි PL 1-2017 වැටුප් ඛණ්ඩයේ ආරම්භක වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ. | ** බාහිර අයදුම්කරුවන් සඳහා*<br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් සමත්වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර)<br>** අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br>(ආ)දැනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 9 වසර (8 ශ්‍රේණිය)සමත් විය යුතුය. |
| 02 | ප්‍රජා ශාලා භාරකරු | 01 | | | |
| 03 | පුස්තකාල සහායක | 01 | | | |
| 04 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 06 | | | |

1. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*
   - 1.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.
   - 1.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
   - 1.3 පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කර සනාථ කර තිබිය යුතුයි.)

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*
   - 2.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ.
   - 2.2 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. පරිවාස කාලය තුළ සිය වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන තිබේනම් සහ පළමු කාර්යක්ෂමතා විභාගය සමත්වී ඇත්නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.
   - 2.3 1/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

3. *බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

3.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් ලිපි ලේඛන හා ඒවායේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

i. උප්පැන්න සහතිකයේ මුල් පිටපත
ii. අධ්‍යාපන සහතිකවල මුල් පිටපත
iii. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය
iv. මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය
v. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්
vi. සේවා සහතික
vii. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික

3.2 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතුරින් වඩාත් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

4. *අයදුම්කළ යුතු ආකාරය ඃ-*

4.1 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි ඒ4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකසන ලද අයදුම්පතක් 2017.12.04 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු නාමය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

4.3 අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු විසින් සහතික කළ යුතුය.

4.4 දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත තමන් සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

4.5 අසම්පූර්ණ හෝ නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

බඳවා ගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක දිනය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් නිශ්චය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන ලද කාලය අතරතුර කාල සීමාවේ හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

එච්. ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් රාජ්‍ය සේවයේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ 111 ශ්‍රේණියේ ........................... ..................... තනතුරට බඳවා ගැනීම***

01. සම්පූර්ණ නම :———————.
02. ජාතික හැඳුනුම්පත් අංකය
03. ස්ථිර ලිපිනය:———————.
04. දුරකථන අංකය:———————.
05. උපන් දිනය: වර්ෂය :———————.මාසය:———————. දිනය:———————.

06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස වර්ෂ:—————. මාස:—————. දින:—————.

07. අධ්‍යාපන සුදුසුකම් :

අවසන් වරට සමත් ශ්‍රේණිය :——————.

අ.පො.ස. සා. පෙළ

පෙනී සිටි වර්ෂය :——————. විභාග අංකය :——————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
| --- | --- |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

08. ඔබ කවදා හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :——————.

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරාගැනීමට පෙර හෙළිවුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුස්සකු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

——————.

දිනය :——————. අයදුම්කරුගේ අත්සන.

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන —————— මයා මා පෞද්ගලිකව හොඳින් හඳුනන බවත් ඔහුගේ අත්සන —————— දින මා ඉදිරිපිට දී තබන ලද බවත් සහතික කරමි.

——————————

(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.)

දිනය :——————.
සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

11. *රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉල්ලුම්කරු වන ......................... මයා අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ/ ආයතනයේ ස්ථිර/අනියම්/ තාවකාලික නිලධාරියකු ලෙස සේවය කරන බවත් ඔහුගේ වැඩ, හැසිරීම සතුටුදායක බවත්, මෙම තනතුර සඳහා ඔහු තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

——————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හෝ
බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

දිනය :——————.
සම්පූර්ණ නම:——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)